

# ගරා යකෙක් වීම්

''ඔන්න එකමත් එක රටක හිටියලු කඩිය කියල බල්ලෙක්. ඌ හරිම සැරයි ලු. කාටවත් ගෙදෙට්ට එන්න දෙන්නෙ නෑලු. ඔන්න ඉතින් දවසක් රෙදි නැන්ද ගෙදෙට්ට ආවලු. එන කොට ම කඩිය බුරාගෙන පැනගෙන ගිහිල්ල රෙදි නැන්දව හපා කෑවලු. රෙදි නැන්ද රෙදි පොට්ටනිය බිමට වීසි කරල දිව්වලු පණ එපා කියල. කඩිය මොකද දන්නවද කළේ. රෙදි පොට්ටනිය ළඟට ගිහින් ඒක දිග ඇරිය කටින් අල්ලල. ගත්ත මැදල තිබුණු හොඳ කලිසමක්. අරං ඇඳ ගත්ත. කමිසෙකුත් ගත්ත. අරං ඇඳ ගත්ත. දැන් කඩිය ඉන්නෙ කකුල් දෙකෙන් ලු. ඔන්න ඒ පාර කඩිය ගේ ඇතුළට ගිහිල්ල ඉස්කෝලෙ. පොත් ටිකක් අතට ගත්තලු. දැන් ඔන්න කඩිය යනව ඉස්කෝලේ. දැන් කඩිය ඉස්කෝලෙ යන කොට මාළු අල්ලන බෝක්කුව ළඟ උපසේන අයියලගෙ ගෙදර වෙරළු ගහ යට ඉඳන් ආවලු තව බලු තඩියෙක්. කඩියව දැක්ක විතරයි ඌ දුවගෙන ආවලු කඩියව හපා කන්න. කඩිය පොත්ටික දාල ආපහු දුවල ආවලු. අර තඩි බල්ලත් කඩියව පස්සෙන් එළෝගෙන එළෝගෙන ආවලු. ඔන්න කරල්දැක්කුවෙ ඇළේ පාලම ළඟ කඩිය නැවතුණාලු. පාලම උඩ නැවතිල ආපහු හැරිල අර බලු තඩියට ගෙරෙව්වලු. ඒ පාර ඌ ආපහු හැරිල දිව්වලු. ඒ පාර කඩිය මොකද කළේ දන්නවද? ඌත් අර බලු තඩිය පස්සෙන් එළෝගෙන ගියා ලු ආපහු. මාළු අල්ලන බෝක්කුව ළඟ නැවතුණු බලු තඩිය ආපහු හැරිල කඩියට ගෙරෙව්වලු. කඩිය මොකද දන්නවද කළේ. ආපහු හැරිල පණ එපා කියල දිව්වලු. දුවන කොට කලිසමයි කමිසෙයි ගැලවිල බිමට වැටුණාලු. ඒ ආපු පාර තමයි අර පුටුව යට හති ඇර ඇර ඉන්නෙ'' සෝමපාල අයියා බෙ-ාරුකතාව අවසාන කළේ එසේ ය.




අපි ළමයි සියලු දෙනා එකතු වී කිසියම් වූ සෙල්ලමක් කිරීමට හැම සවස් කාලයක් ම යොදා ගන්නෙමු. සටපට කරත්තය, ගස් ඇල්ලීම, කාර් එළවීම ආදී වූ නොයෙකුත් සෙල්ලම් කළ අතර බෙ-ාරුකතා කීම ද එක් විනෝදාංශයක් විය. බෙ-ාරුකතා කීම යනු අප කිසිවකු විසින් කතාවක් සිතින් මවාගෙන කියනු ලැබීමයි. එයට මාතෘකාවක් නැත. ඔන්න එකමත් එක රටක යනුවෙන් පටන්ගෙන සතුන්ගේ කතා, මිනිසුන්ගේ කතා ආදී නොයෙකුත් කතා කියන්නෙමු. එක් අයෙක් කතාව කියන අතර අනෙක් අය ඇසිපිය නොහෙළා ඔහුගේ මුහුණ දෙස බලා සිටිති. මැද දී නොයෙකුත් ප්‍රශ්න අසන අවස්ථාවන් ද නැතුවා නොවේ. ගස් ඇල්ලීම යනුවෙන් හැඳින්වෙන ක්‍රීඩාවේ දී සියලු ම දෙනා එක එක ගස් වෙන් කර ගෙන ඒ ගස අල්ලා ගෙන සිටින අතර එක් අයෙක් පමණක් ගසක් අහිමිව සිටියි. ගස් අල්ලාගෙන සිටින අය ගස් එකිනෙකට මාරු විය යුතු ය. මෙසේ මාරුවන අතරතුර දී ගස් අහිමිව සිටින ළමයා හිස් වන ගසක් අල්ලා හිමි කර ගනී. එවිට ගස අල්ලා ගැනීමට නොහැකි වූ කෙනා එවන් වෙනත් අවස්ථාවක් බලා ගසක් හිමි කරගත යුතු වේ.

සටපට කරත්තය යනුවෙන් කරන සෙල්ලම පොල් පිති හා පොල්කටු උපයෝගී කර ගෙන කරනු ලබන්නකි. අලවංගුවකින් පොල්කටු කීපයක් සිදුරු කර ගනු ලැබේ. ඉන් අනතුරුව පෙත්ත නොමැති අලවංගුවක් හෝ අඩි තුන හතරක් දිග අඟලක පමණ විෂ්කම්භය ඇති යකඩ කූරක් බිම සිටුවා, පොල්කටු සියල්ල ම බිම සිට ඉහළට එනතුරු දෙපසට සිටින ලෙස හිල තුළින් යකඩයට ඇතුල් කෙරේ. බිඩංගයක් සහිත ශක්තිමක් දිග පොල්පිත්තක් ගෙන එහි බිඩංගය පැත්ත හිල් කර යකඩය මුදුනින් පොල්කටු වලට ඉහළින් සවි කෙරේ. ඉන්පසු ඇඟ පත ටිකක් ලොකු ළමයෙක් ඒ මතට නගින අතර අනිකුත් අය පොල් පිත්ත ඔසවා අල්ලා ගෙන යකඩ කූර වටා කර කැවෙති. එවිට පොල්පිති බිඩංගය යටින් සටපට - සටපට ශබ්දය නගමින් පොල් කටු පිපිරී කැඩී යයි. එය බලා සිටින පිරිස උඩ පනිමින්, නටමින්, අත්පුඩි ගසමින් දඟලන්නේ ඉතාමත් ප්‍රීතියෙනි.

බට්ටා පැනීම තවත් ක්‍රීඩාවකි. මිදුල මැද අඩි පහක් පමණ පළලට අඩි අටක් පමණ දිගට කොටුවක් ගසා එම කොටුව කොටු හයක් වන සේ බෙදනු ලැබේ. මෙම බෙදීම බොහෝ විට සිදු කරනු ලබන්නේ පය බිම ඇතිල්ලීමෙන් ඉරි ගැසීමෙනි. පිඟන්කටු කැබැල්ලක් රවුම් කොට සාදා ගන්නා බට්ටා කොටු මතට දැමීමෙන් සහ පෑගීමෙන් මෙම ක්‍රීඩාව සිදු කරනු ලබයි. දරුවන් කීප දෙනෙකුට වුව ද සෙල්ලම් කළ හැකි මෙය කරන ආකාරය මෙසේ ය.

පළමුව එක් ළමයෙක් බට්ටා අතට ගෙන මුල් කොටුවට දමයි. කොටුවලින් පිටත සිට බට්ටා මතට තමා සිටි තැන සිට ම තනි කකුලෙන් පැන එය තනි කකුලෙන් ම ඊළඟ කොටුවට ලිස්සා යවයි. ලිස්සා ගිය බට්ටා මතට තමා සිටි තැන සිට පනියි. මෙසේ බට්ටා පයින් ලිස්සා යවා සියලු කොටු නිම කරයි. හයවැනි කොටුවේ සිට බට්ටා එළියට විසි වන සේ පයින් ඉවතට තල්ලු කොට ඒ මතට පනී. පසුව බට්ටා අතට ගෙන කොටුවලට පිටු පා හිසට ඉහළින් එපිටට වන සේ විසි කරනු ලැබේ. පසුව සාමාන්‍ය ලෙස බට්ටා ළඟට ගොස් එය අතින් රැගෙන උඩින් ද යටින් ද යනුවෙන් අසා අනිත් අය කියන පරිදි කොටු වලට පි-ටුපා හිසට ඉහළින් හෝ දෙකට නැමී දෙකකුල් යටින් කොටු තුළට දමයි. වැටෙන කොටුව ඔහුට හෝ ඇයට හිමි වේ. මෙසේ සියලු ම කොටු තමා විසින් ම හිමි කර ගත්තොත් දිනුම හිමි වේ. බට්ටා පයින් තල්ලු කරන විට ඉරක් මත නැවතීම හෝ නියමිත කොටුවට නොව වෙනත් කොටුවකට දැමුවොත් එතැනින් ඔහුගේ ක්‍රීඩා වාරය අවසන් වේ. එසේ නොවී දෙවන හෝ තෙවන වර පනින විට තමා හිමි කර ගත් කොටුවල පා දෙක ම බිම තබා සිටීමට අවසර ඇත. එසේ ම හිසට ඉහළින් බට්ටා විසි කරන විට කොටුවලින් පිටතට විසි වුවහොත් ඉවත් විය යුතු වේ. ඊළඟට අනිත් කෙනෙකුට ක්‍රීඩා කළ හැකි ය. මෙසේ සියලු ම දෙනා ක්‍රීඩා කර අවසානයේ වැඩි කොටු ප්‍රමාණයක් ලබා ගත් අය ජයග්‍රහණය කරයි.

මෙවැනි වූ තවත් ක්‍රීඩාවකි චක්කරන් පැනීම. ඉහත සඳහන් ආකාරයට කොටු ගසා ගැනීමෙන් සහ බට්ටෙකු උපයෝගී කර ගනිමින් මෙම ක්‍රීඩාව ද කරනු ලබයි.

"ටීක් ගැසීම" අප අතර බෙහෙවින් ප්‍රචලිත වූ ක්‍රීඩාවකි. මිල දී ගනු ලබන වීදුරුබෝල උපයෝගී කොට මෙම ක්‍රීඩාව සිදු කෙරේ. අප වෙන වෙන ම මිල දී ගනු ලබන ටීක් ප්‍රමාණය, ක්‍රීඩා කිරීමෙන් අත්වන දිනුම නිසා වැඩි කර ගත හැකි ය. පරාජයක දී තමා අත ඇති වීදුරු බෝල ප්‍රමාණය අඩු වේ. පළමුව වීදුරුබෝල කීපයක් පිරවීමට හැකි ප්‍රමා-ණයේ පුංචි වළක් මිදුලේ හෝ ඉඩ ඇති ස්ථානයක හාරා ගෙන එයට වියතක් වැනි දුරකින් ඉරක් අඳිනු ලැබේ. එම ඉරට අඩි දහයක් පමණ දුරකින් යටි පතුල කරකැවීමෙන් කේන්ද්‍රස්ථානයක් සකස් කර ගනී. පළමුව එකිනෙකා නියමිත දුර ස්ථානයේ සිට පළමුව හාරන ලද වළට එක් ටීක් බෝලය බැගින් දමනු ලැබේ. වළට හෝ වළ අසලට වැටෙන දුර ප්‍රමාණය අනුව පළමුවැන්නා, දෙවැන්නා තෝරා ගනු ලැබීමෙන් පසුව ක්‍රීඩාව පටන් ගනිති.

පළමුවැන්නා සියලු දෙනාගේ ටීක් බෝල අතට ගනී. නියමිත කේන්ද්‍රස්ථානයේ සිට සියලු ම බෝල වළට වැටෙන සේ වළ කිට්ටුවට දමයි. කිසියම් ආකාරයකින් බෝලයක් හෝ දෙකක් ඉහත සඳහන් කළ වළට වැටුණොත් එම බෝල ඔහුට හිමිවේ. බෝල දැමීමේ දී වළට කිට්ටුව ගසා ඇති ඉරට මෙපිටින් සියලු ම බෝල නැවතුණ හොත් ඔහුගේ වාරය අවසන් වේ. එසේ නොමැතිව එක බෝලයක් හෝ දෙකක් ඉරෙන් මෙපිට නැවතුණ හොත් ඉන් වඩාත් ම ඉරට දුරින් ඇති බෝලයට තමා අත ඇති බෝලයකින් ගසා ඉර පසුකර යැවීමට සැලැස්විය යුතු ය. සියලු ම බෝල ඉර පසුකොට ගොස් වළට වැටී හෝ නොවැටී නැවතුණු කල අනෙකෙකු පවසන බෝලයකට තමා අත ඇති ටීක් බෝලයකින් ගැසිය යුතු ය. එසේ ගැසීමට හැකි වුව-හොත් එම බෝලය සහ වළට වැටී ඇති බෝල සියල්ල තමන්ට හිමි වේ. මෙම ක්‍රීඩාව රබර් ඇට, දොඹඇට ආදිය ද යොදාගෙන කරනු ලැබේ.

කාර් එළවීම ද අපගේ තවත් ක්‍රීඩාවකි. ගෙවල් වටා ඇති අඩි පාරවල් ඔස්සේ කාර් ධාවනය කරන්නෙමු. මග තැනින් තැන සිටුවා ඇති ගියර් එක මාරු කරමින් හෝන් ගසමින් බිරු......ම් බිරු.............ම් පී.........ප් පීප් යන අනුකරණ ශබ්දයකුත් ඇති කරමින් අපි එකිනෙකා පරදවමින් කාර් ධාවනය කරන්නෙමු.

මෙම ක්‍රීඩාවන්ට අමතරව දිවීම, පැනීම ගල්වළට පැන පිහිනීම ආදී නොයෙකුත් ක්‍රීඩා කරන අතර ඒ ඒ අවස්ථාවන් හි දී නිර්මාණය කර ගනු ලබන ක්‍රීඩා ආදිය ද කළෙමු.

බයිට් මහත්තයලාගේ නිවසේ පැවැත්වුණු දෙවොල් මඩු ශාන්ති කර්මයක් නැරඹීම සඳහා සෝමපාල අයියා ඇතුළු අපි කීප දෙනා ම ගියෙමු. එදින එය ඉතාමත් අලංකාරව මෙන් ම ඉතා විශාල ලෙස කරන ලද මඩුවකි. මිදුල පුරා සාදන ලද මල්පහන්පැල රාශියකින් යුතුව බෙර හතරක් සමග විශාල නර්තන ශිල්පීන් රැසක් සම්බන්ධ කර ගනිමින් කරන ලද මෙම දෙවොල්මඩු පූජාව නැරඹීම සඳහා විශාල පිරිසක් පැමිණ සිටියහ. එම දෙවොල්මඩු නැටුමට රබලියේ පත්තිනි මහතා සහ සුදු මහතා ද පැමිණ සිටියහ. රබලියේ පත්තිනි මහතා එදින කිසිවක් පානය කරන විට පාවිච්චි කළේ අලුත් ම අලුත් නෑඹිලියකි. පත්තිනි මහතා වයසින් වැඩිහිටියකු වුවත් පත්තිනි දේවිය සේ වෙස් මාරුකොට සාරියක් ද ඇඳ සිටි විලාසය මෙන් ම රංගනයේ යෙදුණු විලාසය ද ඉතාමත් මනස්කාන්ත ය. වාහල නැටුම සඳහා සිටි රංගන ශිල්පියා, වාහල තොප්පිය ද පැළඳ, දෑතට පන්දම් දෙක ද රැගෙන කරන වේගවත් නැටුම සහ වේගවත්ව දිවූ විලාසය ද, ඔහු පසුපස දුම්මල ගොටුව රැගෙන දුවන පිරිසගේ හැසිරීම් විලාසය ද දකින අප සිටියේ මහත් ලෙස බයේ වෙවුලමිනි. එදා පාන්දර ගරායක් ශාන්තිය සඳහා වෙස් බැන්දේ අතුර මූකලානේ උක්කුවා ගුරුන්නාන්සේ ය. ඉතාමත් විනෙ-ෝදජනක ලෙස කරන ලද ගරායකුම දෙස අප හැම දෙන ම බලා සිටියේ බෙර කරුවන් වූ ඩොංගා ගුරුන්නාන්සේ සහ සුරා ගුරුන්නා-න්සේ සමග ගරායකා කළ ඉළ ඇදෙන විහිළුතහළු පිරි විකට රංගනය දෙස ඇසිපිය නොහෙළා ය.

මෙම ශාන්ති කර්මය නැරඹීමට ගිය දාට පහුවදා සවස සෝමපාල අයියා උඩහ ගෙදර සිට අපේ ගෙදරට ආවේ කලබලයෙනි.

**මම දන්නා සියලු ම නැටුම් නටා හමාර කොට ගොරකා ගසට හෙවත් අයිලයට නැගුණෙමි. අයිලයේ ඉහළ ම ලීයට නැග දෙපසට කකුල් දමා ඒ මත වාඩි වී බෙරකරුවා සමඟ දෙබස් කියා අයිලය පදින්නට පටන් ගතිමි.**

"ඊයි අපි ගරායකා නටමු.'' සෝමපාල අයියා පැවසුවේ ය.

''අන්න මරු "හා" "ශෝක්" අපි කීප දෙනෙකුගේ මුවගින් පිටවිණි.

මා, සෝමපාල අයියා, ගුණපාල මල්ලී, සිරිපාල මල්ලී, කමලා, ශ්‍රදානා සහ රංජි යන අප පිරිස එකිනෙකාගේ කාර්යයන් වෙන්කර ගතිමු. මා ගරායකා ය. සෝමපාල අයියා බෙරකරුවා ය. ගුණපාල දුම්මල දෙන්නා සහ කොට්ටෝරුවා ය. ආවඩ දෙන කෙනා ඇතුළුව පිරිස තෝරා ගැනීමෙන් අනතුරුව අයිලය සෑදීමට කළමනා රැස් කොට ගතිමු. දර සඳහා ගෙනැවිත් තිබුණු දිග වියළි රබර් අතු දෙකක් මිදුල මැද සිටුවා ගතිමු. මෙම ලී දෙක හරහා අඩියෙන් අඩියට මෙන් දර කැබලි බැඳ කැකිල්ල සහ බෝවිටියා ආදී කැලෑ කොළවලින් අයිලය සැරසුවෙමු. මුදුනේ ලාඩප්පා අතු කැබලි දෙකක් ගැට ගසා ගොරකා ගස් සකස් කර ගතිමු. උණ බම්බු කැබැල්ලකට රබර් පොල්ක-ටුපාලු දෙකක් දෙපස බැඳ බෙරය සාදා ගතිමු.

මා ගරායක් මූණ සාදා ගත්තේ කොළපතකිනි. දැන් අප ගරා යක් නැටුමට සූදානම් ය. සෙ-

16 වන පිටට